# " දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති "
# වැඩලෝකයට අවශ්‍ය නිපුණතා ලබා දීමට දරණ දායකත්වය
# පිළිබඳ ව කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

අධ්‍යාපන දර්ශනපති නිබන්ධනය

අධ්‍යාපන පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ 3.

2004/2006

UCLIB

544771

ඒ. මහලේකම් ( 2004 / **Mphil**-26 )

**( B.A, Dip in Education, M.Ed )**

## සංක්ෂිප්තය

දැඩි විභාග කේන්ද්‍රීය විධිමත් ඉගෙනුමෙන් ශිෂ්‍යයා මුදවා, ස්වයං පෙළඹුම් අධ්‍යාපනය මගින් ප්‍රායෝගික ලෝකය පිළිබඳ අත්දැකීම් ලබා ගනිමින්, අනාගත වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා සහිත පුරවැසියන් බිහි කිරිම, උසස් පෙළ විෂය මාලාවට නිපුණතා සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දීමේ ප්‍රමුඛතම පරමාර්ථයයි. එම අපේක්ෂිත අරමුණු කෙතෙක් දුරට ඉටු වී තිබේ ද ? යන්න විමර්ශනය කිරිම මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය විය. ඒ අනුව ව්‍යාපෘතිකරණය, අධ්‍යාපනයේ ප්‍රායෝගිකත්වය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය, වැඩලෝකය, යනාදිය පිළිබඳව දේශීය හා විදේශීය පර්යේෂණ සාහිත්‍යය විමසීමට ලක් කරන ලදී.

මෙම අධ්‍යයනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල මාධ්‍ය පාසල් දොළහක උසස් පෙළ සිසුන් 360 කගේ සහ වැඩ ලෝකයට පිවිසි (2002-2003 වසරවල උසස් පෙළ හමාර කළ) ශිෂ්‍යයින් 100 කගෙන් ද, ව්‍යාපෘති කමිටු ගුරුවරුන් ඇතුළු උසස් පෙළ විෂයභාර ගුරුවරුන් 60 දෙනෙකුගෙන් ද, ප්‍රශ්නාවලී මගින් තොරතුරු ලබා ගන්නා ලදී.

එම දත්ත වගු, ප්‍රස්තාර, හා ප්‍රතිශත මගින් විශ්ලේෂණය කරන ලදී. සිසුන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලබා ගත් දත්ත වැඩි දුරටත් විමර්ශනය කිරිම සඳහා විදුහල්පතිවරුන් හා අධ්‍යාපනඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර, එම ප්‍රතිචාර ගුණාත්මකව විග්‍රහ කරන ලදී.

ව්‍යාපෘති වැඩසටහන වර්තමානයේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දත්ත විශ්ලේෂණයේ දී, අපේක්ෂිත පරමාර්ථ ඉටු කර ගැනීමට වැඩසටහන එතරම් දායකත්වයක් ලබා දී නොමැති බව අනාවරණය විය. විශේෂයෙන්ම මෙම වැඩසටහනේ වැදගත්කම, නිපුණතා ඉටු කර ගත හැකි ආකාරය මෙන්ම ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සිසුන්, ගුරුවරුන් මෙන්ම විදුහල්පතිවරුන් ද ලබා තිබු දැනුවත් වීම පුහුණුව ප්‍රමාණවත් නොවන බව අනාවරණය විය. සිසුන් තුළ මෙන්ම ගුරුවරුන් තුළද පවතින දැඩි විභාග මානසිකත්වය මෙවැනි ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රම ශිල්ප අඩු තක්සේරුවකට ලක් වීමට බලපාන ප්‍රධාන හේතුවක් බව අනාවරණය විය. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා කිසිදු බලපෑමක් සිදු නොවීමත්, සමාජයේ රැකියා සඳහා අවශ්‍යතා පුරණයේ දී මේ සඳහා වටිනාකමක්, ඇගයීමක්, නොලැබීමත්, ව්‍යාපෘති ඇගයීම සඳහා ක්‍රමවත්, විධිමත්, වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීමත් යනාදි කරුණු වැඩ සටහන දියාරු ස්වරූපයකින් ක්‍රියාත්මක වීමට බලපා ඇති බව අනාවරණය විය.

නමුත් මෙහිදී අනාවරණය වු වැදගත් කරුණක් වූයේ වැඩි පිරිසක් සාර්ථකත්වයට පත්ව නොසිටියත් උපරිම මට්ටමෙන් අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීමට සිසුන්ගෙන් සුළු පිරිසකට හෝ හැකියාව ලැබී තිබීමයි. එහිදී ඕනෑම රැකියාවක් කිරීම සඳහා අවශ්‍ය නිපුණතා ලබා ගෙන තිබු අවස්ථා ද, වැඩලෝකයට ප්‍රවිෂ්ට වූවන්ගේ අත්දැකීම් තුළින් අනාවරණය කර ගැනීමට හැකි විය. ස්වයං රැකියා ලබා ගැනිමට, අමතර ආදායම් මාර්ග සොයා ගැනීමට, විවේකය ඵලදායිව ගත කිරිමට මෙන්ම තමන්ගේ සහජ දක්ෂතා එළි දැක්වීමටත්, ඔවුන් ව්‍යාපෘති තුළින් ලබා ගෙන තිබු පන්නරය, මෙම වැඩ සටහන තුළින් වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා වර්ධනය කර ගැනීමට ඇති ශක්‍යතාවය පෙන්වීමට තරම් ප්‍රබල විය.

ව්‍යාපෘති පිළිබඳ ආකල්ප විමසීමේදී පැහැදිලි වූයේ සිසුන්ගෙන් වැඩි දෙනෙකු තුළ මේ සම්බන්ධයෙන් උදාසීන සෘණාත්මක ආකල්ප පවතින බවයි. ගුරුවරුන් මෙන්ම විදුහල්පතිවරුන් ද මේ සම්බන්ධයෙන් ධනාත්මක ආකල්ප දරණ බව පෙනී ගිය ද, වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සතුටු විය හැකි අන්දමේ ප්‍රමාණවත් සහයෝගයක් ඔවුන්ගෙන් ද ලැබී නොතිබුණි. ව්‍යාපෘතිකරණයේ දී සිසුන්ට, ගුරුවරුන්ට, මෙන්ම විදුහල්පතිවරුන්ට ද විවිධාකාරයේ ගැටලුවලට මෙන්ම අභියෝගවලට ද මුහුණ දීමට සිදු වී ඇති බව අනාවරණය විය.

අවසාන වශයෙන් ව්‍යාපෘතිකරණයේ දි අදාළ පාර්ශ්වකරුවන් මුහුණ දුන් ගැටලුවලට විසඳුම් සහ යෝජනා ඉදිරිපත් කිරිමක් ද, මෙම වැඩසටහනේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි ඵලදායිතාව වැඩි කළ හැකි ආකාරය පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමක් ද සිදු කරන ලදී.

## Abstract

Competency developing projects were introduced to the A/L syllabus with the goal of gifting a competent citizen armed with the skills needed for the world of work through real experience and self motivated education rather than the strict examination oriented system present today.

The objective of this project is to study to what extent the above goal has been reached through competency developing project for living programme practicability in education, project system and student centered education were referred.

For this study information was collected from 360 A/L students studying at 12-Sinhala medium schools in Kandy district along with hundred students who have entered different jobs (after completing A/Ls in the year 2002-2003) and sixty A/L teachers including the teachers in-charge of project programme. Data gathered through questionnaires were analyzed by means of Charts, diagrams and percentages. For further details school principals and educationists were interviewed and their responses were subjected to qualitative analysis.

The results of the data analysis showed that the A/L project programme did not contribute much for brining out the expected results. The students, teachers as well as principals were not well informed on the importance of the project progarmme or its competency developing strategies and implementation. The strict examination oriented mentality existing among teachers and students alike compel them to regard student centered educational strategies with low esteem. The fact that project marks have no influence on university entrance, or gaining job opportunities is a major disadvantage in the project programme. Having no

**systematic criteria for the evaluation of projects is also responsible for the ineffective implementation of the programme.**

**But the results revealed an important fact. Although the majority fails to gain maximum benefit, a minority of the A/L students were able to reach the expected competency levels with the help of project making competencies to engage in a specific profession or any job in general were gained by some of the ex-students who have entered the professional world. The experience gained by students through developing in born talents, initiating self-employment as well as spending leisure time usefully showed the programme's potential in building skills needed for professional world.**

**The attitude of many students towards the programme was a negative one. Though teachers and principals viewed the project programme in a positive light, their active contribution in implementing the programme was at an insufficient level.**